හලාවත ප්ලාන්ටේෂන්ස් ලිමිටඩ් - 2019
---------------------------------------

**1.1** තත්ත්වාගණනය කළ මතය
---------------------------

විලව් ප්ලාන්ටේෂන්ස් ලිමිටඩ් ("සමාගම") හි 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2** තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
----------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම
------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධිත පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

**1.4** විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)
-----------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය

කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අදහස් දැක්වීම

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 51 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් 2018 වර්ෂය වනවිට සම්පූර්ණයෙන්ම ක්ෂය කර අවසන් කර ඇති පිරිවැය රු.මිලියන 130.3 ක් වූ වාහන 08 ක්, යතුරුපැදි 18 ක් සහ කෘෂිකාර්මික වාහන තවදුරටත් ධාවන තත්ත්වයේ පැවතුණද එම ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කර නිවැරදි ධාරණ අගය මූල්‍ය ප්‍රකාශවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | මෝටර් රථ ප්‍රත්‍යාගණන කිරීම සඳහා 2018 වර්ෂයේ දී තක්සේරු දෙපාර්තමේන්තුව වෙත පැවරුව ද එම වාර්තා 2019.12.31 දින වන විටත් හලාවත වැවිලි සමාගම වෙත ලැබී නොමැත. කෙසේ වෙතත් මෙම වර්ෂය තුළදී මේ පිළිබඳව ඔවුන් වෙතින් විමසීම් කිරීමටත් එම තක්සේරු වාර්තා ලබා දීමේ ප්‍රමාදයක් පවතී නම් වෙනත් සුදුසුකම්ලත් ආයතනයක් මගින් හෝ අදාළ ප්‍රත්‍යාගණනය සිදුකිරීමට අවධානය යොමු කර ඇත. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයන්ගේ ප්‍රතිපාදනවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ජනතා වතු සංවර්ධන මණ්ඩලය විසින් 1992 වර්ෂයේදී සමාගම වෙත ලබාදුන් ඉඩම් හෙක්ටයාර් 5733 න් සමාලෝචිත වර්ෂය අවසානයට අනවසර අත්පත් කරගැනීම්, පොදු පහසුකම් සඳහා වෙන්කිරීම්, රජයේ අවශ්‍යතා සඳහා වෙන් කිරීම් වැනි හේතු මත සමාගමට අහිමි වූ රු.මිලියන 4.6 ක් වටිනා ඉඩම් හෙක්ටයාර් 184.15 ක් ගිණුම්වලින් ඉවත් කිරීමට අවශ්‍ය ගැලපීම් සිදුකර නොතිබුණි. | මෙම ඉඩම් 1976 වර්ෂයේදී ජනවසම වෙත පවරා දී ඇත. 1992 වර්ෂයේදී ජනවසම යටතේ කළමනාකරණය කරන ලද ඉඩම් බදු ගිවිසුමට අනුව හලාවත වැවිලි සමාගමට පවරා ඇත. ඇතැම් ඉඩම් භෞතිකව හලාවත වැවිලි සමාගම වෙත පැවරී නොමැත. ඉඩම් හෙක්ටයාර් 185.15 ක ප්‍රමාණයේ වර්ථමාන තත්වය සැලකීමේදී වර්ෂ 1992 පෙර නිදහස් වී ඇති ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 141.66 ක් ලෙසට දැක්විය හැකිය. | නිදහස්කළ ඉඩම් වල වටිනාකම මූල්‍ය ප්‍රකාශන වලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | භූමිය පිළිබඳව අධ්‍යයනයකින් තොරව, සමාගම විසින් **2013** හා **2014** වර්ෂයන්හි රු.මිලියන **4.45** ක වියදමින් පුත්තලම, මංගලඑළිය වතුයායේ හෙක්ටයාර් **18.75** ක භූමියක ආරම්භ කර තිබුණු කජු ගස් **3,850** ක වගාවක් **2015** වර්ෂය වන විට සම්පූර්ණයෙන්ම විනාශ වී තිබුණ ද, ඊට අදාළ ගැලපිලි ගිණුම්වල සිදුනොකර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල මෙම වියදම ප්‍රාග්ධනිත කර තිබුණි. | මෙම හෙක්ටයාර **18.75** ක ව්‍යාපෘති **2** තුළ **2013** වර්ෂයේ ආරම්භ කරන ලද හෙක්ටයාර **10.75** ක කජු වගාව වෙනුවෙන් **2013** වර්ෂයේ සිට **2015** වර්ෂය දක්වා දරණ ලද රු. **3,740,610** ක පිරිවැයක් අන්තර්ගත වේ. **2013** වර්ෂයේ මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් දරා ඇති මුලු පිරිවැය රු. **2,975,720** කි. අධ්‍යක්ෂක මණ්ඩලයට යොමු කර අසාර්ථක වී ඇති වගාවන් සම්බන්ධයෙන් අවසන් තීරණයක් ගැනීමට අපේක්ෂිතය. | භෞතිකව නොපවතින වත්කම් ගිණුම් වලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |

**1.6** නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම
---------------------------------------------------------------------------

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

| | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **2019** ජූලි **30** දින හලාවත සහ පළුගස්වැව අලෙවි මධ්‍යස්ථාන දෙකෙහි සහ පළුගස්වැවව කජු සැකසුම් මධ්‍යස්ථානයේ ලේඛනගත තොග ශේෂයන් සහ භෞතික තොග ශේෂයන් අතර, රු.**551,581** ක් වටිනා නිමි කජු කි.ග්‍රෑ.**259** ක ඌනතාවයක් පැවැති අතර, පළුගස්වැව හා ප්‍රධාන කාර්යාලයේ රු.**76,860** ක් වටිනා පොල්තෙල් බෝතල් **200** ක ඌනතාවයක් පැවතුණි. **2020** ජූලි **31** දින වන විටත් මෙම ඌනතාවයන් සඳහා වගකිව යුතු නිලධාරින්ට එරෙහිව ඉදිරි ක්‍රියාමාර්ග කිසිවක් ගෙන නොතිබුණි. | එකී විගණන විමසුමෙහි සඳහන් කරුණු පිළිබඳව මූලික විමර්ශන කටයුතු පැවැත්වෙමින් තිබෙන බව මෙයින් දන්වා සිටින අතර, එකී කටයුතු අවසන් වූ පසු අදාළ සිද්ධිය පිළිබඳව අප ගන්නා ක්‍රියාමාර්ග ඔබ වෙත දන්වා එවීමට කටයුතු කරන බව මෙයින් දන්වා සිටිමි. | තොග ඌනතාවයන්ට වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් කටයුතු කිරීමටත්, අදාළ පාඩු අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| (ආ) | **2006** ජනවාරි **25** දිනැති අංක **08** දරන ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතන චක්‍රලේඛයේ **2.14.1** මාර්ගොපදේශය ප්‍රකාරව රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා නොගෙන රු.**488,604** ක් වැයකර වාහනයක් අලුත්වැඩියා කර තිබුණි. | හදිසි අලුත්වැඩියාවක් ලෙස නියෝජිත ආයතනයෙන් ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය මත සිදු කරන ලදී. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ ප්‍රතිපාදන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | **1994** ජුනි **14** දිනැති අංක **95** දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ **02** ඡේදයේ විධිවිධානවලට පටහැනිව සමාගමේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ සහ මාණ්ඩලික නිලධාරීන් **28** දෙනෙකු සඳහා රු.මිලියන **1.72** ක අයවැයගත දීමනා, රු.මිලියන **2.12** ක රියදුරු දීමනා සහ මධ්‍ය හා පහළ මට්ටමේ | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත්තේ රියදුරු දීමනාව නොව ප්‍රවාහන දීමනාවක් වන අතර එය ලබාදී ඇත්තේ මනා අධ්‍යයනයකින් පසුව වේ. ප්‍රවාහන දීමනාවක් ලබාදීම තුළින් සේවකයන්ගේ අභිප්‍රේරණය | චක්‍රලේඛයේ ප්‍රතිපාදන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කළමනාකරුවන් නව දෙනෙකු සඳහා රු.438,934 ක ගමනාගමන දීමනා සමාලෝචිත වර්ෂයේදී ලබා දී තිබුණි. | බලාපොරොත්තු වන අතර ඒ තුළින් සමාගමේ ඉලක්ක කරා යාමට රුකුලක් වනු ඇත. | |
| (ඇ) | 2015 මැයි 25 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 02 ඡේදය අනුව දුරකථන දීමනාව සඳහා සුදුසුකම් නොලබන නිලධාරින් දස දෙනෙකුට රු.102,167 ක දුරකථන දීමනාවක් ගෙවා තිබුණි. | අවම සේවක සංඛ්‍යාවක් යොදා ගනිමින් උපරිම සේවාවක් ලබා ගැනීමට සමාගම නිතරම කටයුතු කරයි. ඒ අනුව රාජකාරී කටයුතු කර ගැනීමේදී අවම සේවක ප්‍රමාණයක් යොදා ගෙන මෙවැනි දීමනාවක් ලබා දී රාජකාරී කර ගැනීම පහසු වේ. | චක්‍රලේඛයේ ප්‍රතිපාදන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2015 මැයි 25 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 3.3.2.1 ඡේදය අනුව රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියකින් තොරව සභාපතිවරයා විසින් අනුමත ඉන්ධන සීමාව ඉක්මවා රු.352,690 ක ඉන්ධන ලබාගෙන තිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩලයට කරුණු දක්වා වැය වී ඇති ඉන්ධන සඳහා අනුමැතිය ලබා ගෙන ඇත. සභාපතිතුමා විසින් සීමාව ඉක්මවා භාවිත කරන ලද ඉන්ධන සඳහා අමාත්‍යාංශ ලේකම්තුමාගේ අනුමැතියට යොමු කර තිබුණ ද අමාත්‍යාංශ මාරුවීම් සහ වෙනස්වීම මත ඒ සඳහා මෙතෙක් අනුමැතිය ලබා දී නොමැත. | චක්‍රලේඛයේ ප්‍රතිපාදන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රතිඵලය රු.47,396,415 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපිව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.32,301,910 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.79,698,325 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි. සමාලෝචිත වර්ෂයේදී ප්‍රධාන භෝග වගාවන් වන පොල් සහ කජු වගාවන් අලෙවියෙන් ලද ලාභය පෙර වර්ෂයට සාපේක්ෂව රු.63,670,269 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලය වර්ධනය වීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමණාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණ ඉදිරිපත් කෙරේ.

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ජූලි 05 දින පළුගස්වැව වතුයායේ පැවති උත්සවයකට අදාළව පුවත්පත් දැන්වීම් පල කිරීම, ආහාරපාන, තෑගි හා වෙනත් වියදම් වශයෙන් රු.707,991 ක්ද, මෙම උත්සවය සඳහා සහභාගී වූ දින වැටුප් ලබන වතු සේවකයින් 616 දෙනෙකු සඳහා | පුවත්පත් දැන්වීම් පලකිරීම සඳහාත් අදාළ ගාස්තු සඳහාත් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගත් අතර වතු කොට්ඨාශවලින් එම මුදල් ප්‍රතිපූරණය කර ගැනීමට කටයුතු කර ඇත. ප්‍රධාන | වියදම් දැරීමේ දී අදාළ වියදම් සමාගමේ අරමුණු ඉටුකර ගැනීම කෙරෙහි අදාළ ද යන්න සලකා බලා |

| | | | |
|---|---|---|---|
| | රු.462,000 ක දින වැටුප්ද සමාගම විසින් ගෙවා තිබුණි. | කාර්යාලය විසින් වියදම් කළ යුතු මුදල් ලෙස ඔබ දක්වා ඇති මුදල හඳුනාගෙන පළාගස්වැව වත්තට ප්‍රතිපූරණය කිරීමට කටයුතු කරන ලදී. | වියදම් දැරිය යුතුය. |
| (ආ) | සමාගමට ණය දීමටත්, මෙහි සඳහන් සංස්ථා, සමාගම් හා අමාත්‍යාංශවලට ණය ගැනීමටත්, නීත්‍යානුකූල බලයක් නොමැති වුවද, සමාගම විසින් ජනතා වතු සංවර්ධන මණ්ඩලය, ඇල්කඩුව වැවිලි සමාගම, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව, රාජ්‍ය සම්පත් ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය හා රබර් නිෂ්පාදන අපනයන සංස්ථාවට, 2010 වර්ෂයේදී ලබා දී තිබූ රු.මිලියන 105 ක ණය මුදල හා සමාලෝචිත වර්ෂය අවසානයට ඒ සඳහා අදාළ පොලියද සමඟ එකතුව රු.මිලියන 164.5 ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විට කටයුතු කර නොතිබුණි. | හලාවත වැවිලි සමාගම විසින් රාජ්‍ය ආයතන වෙත ඔවුන්ගේ කෙටිකාලීන කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා අමාත්‍යාංශ ලේකම්තුමාගේ ද උපදෙස් පරිදි 2010 වර්ෂයේ දී රුපියල් මිලියන 105 ක මුදලක් ණය මුදල් ලෙස ලබා දී ඇත. කෙසේ වෙතත් එම ආයතන කිසිවක් ගිවිසුම් ප්‍රකාරව ණය මුදල් හෝ පොලී මුදල් මේ වන විටත් ගෙවීම් කර නොමැත. මෙම මුදල් අයකර ගැනීම සඳහා එක් එක් ආයතන වෙත නිරන්තර ලිපි යොමු කර තිබුණ ද එම මුදල් අය වී නොතිබිණි. | මෙම ණය ශේෂයන් අයකර ගැනීමට කඩිනමින් කටයුතු කල යුතුය. |

**3.2** මානව සම්පත් කළමණාකරණය

---------------------------------

පහත නිරීක්ෂණය ඉදිරිපත් කෙරේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසන් වන විට ජ්‍යෙෂ්ඨ මට්ටමේ සහ තෘතියික මට්ටමේ තනතුරු 17 ක නිලධාරීන් 35 දෙනෙකුගේ පුරප්පාඩු පැවතුණි. මෙම පුරප්පාඩු පිරවීමට හෝ වර්තමාන සේවක අවශ්‍යතා මත තනතුරු හා සේවක සංඛ්‍යාව සමාලෝචනය කර ගැනීමට කටයුතුකර නොතිබුණි. තවද ප්‍රධාන අභ්‍යන්තර විගණක, සහකාර කළමනාකරු සහ සහකාර ගණකාධිකාරි යන තනතුරු සඳහා නිලධාරීන් වර්ෂ 10 ට පෙර බඳවාගෙන තිබුණද, මෙම තනතුරු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරවා ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණු අතර, රියදුරන් දෙදෙනෙකු සහ කම්කරුවන් දෙදෙනෙකු අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා බඳවාගෙන තිබුණි. | කළමණාකාරිත්වය නිශ්චිත පිළිතුරක් ලබා දී නොතිබුණි. | සමාගමේ වර්තමාන සේවක අවශ්‍යතාවයන් අනුව අදාළ තනතුරු අනුමත කරවාගැනීමට කටයුතු කිරීමටත්, කිසිම අවස්ථාවක අනුමත අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා බඳවා ගැනීම් සිදු නොකරන බවටත් කළමනාකාරිත්වය වගබලා ගත යුතුය. |